සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 6 ශ්‍රේණිය

කාලය : පැය $1\frac{1}{2}$
Time : $1\frac{1}{2}$ hours

## Drama

නාට්‍ය හා රංගකලාව

Name :- ................................................... Grade : -................ Index number:-...................

### I කොටස

- **ප්‍රශ්න අංක 01-20 දක්වා සියලුම ප්‍රශ්න සඳහා වඩාත් හා නිවැරදි පිළිතුර තෝරන්න.**

1. නාට්‍ය යනු, කෙටියෙන් දැක්විය හැක්කේ මින් කුමකින්ද?
   (1) යමක් කර පෙන්වීමකි. (2) කතාවක් කීමකි.
   (3) බැලීමට පමණක් ඇත්තකි. (4) ඇසීමට පමණක් ඇත්තකි.

2. චරිතයක් අනුකරණය කිරීමේ දී ඉතා වැදගත් වන්නේ,
   (1) චරිතයට ගැළපෙන ඇඳුම් පැලඳුම් (2) චරිතය පිළිබඳ මනා අවබෝධය
   (3) චරිතයට ගැළපෙන වේෂ නිරූපණය (4) චරිතය පිළිබඳ තොරතුරු අසා තිබීම.

3. කම්මැලි මී යන්ගෙන් අපට පාඩම් ලබා ගත හැකි නාට්‍ය ලෙස.
   (1) දික්තල කාලගෝල (2) මාෂා සහ වලහා
   (3) අමරගියා දිව්‍යලෝකෙ (4) පුංචි අපට දැන් තේරේ.

4. සංස්කෘත හා සාමාජීය වටිනාකමක් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණයේදී යොදා ගත හැක.
   (1) සිරිත් මල්දම (2) නාට්‍ය ගීත
   (3) නම් පොත (4) බුද්ධගජ්ජය

5. අනාගත පරපුරට විශාල ප්‍රයෝජනයක් වන ජනකතා පැවත එන්නක් ලෙස දැක්විය හැක්කේ,
   (1) පොත්පත් වලය (2) සංදේශ කාව්‍යවලය
   (3) මුඛපරම්පරා ගතවය (4) නාට්‍යවලය

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රශ්න හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

6. ජනකතා ඇසුරින් ජීවිතයට ආදර්ශ ලබාගත නොහැක. ( )
7. නාට්‍ය රඟදැක්වීමේ දී කටහඬ පිළිබඳ සැලකිලිමත් වීම අවශ්‍ය නැත. ( )
8. මනස හා ශරීරය අතර සම්බන්ධතාව ගොඩ නැගීම සඳහා චලන විදි වැදගත් වේ. ( )
9. නාට්‍ය පෙළ යනු සංවාද පේළියකි. ( )
10. පරිකල්පන අභ්‍යාස වලින් නිර්මාණශීලි ගුණය වර්ධනය කරගත හැක. ( )

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

- **ප්‍රශ්න අංක 11-15 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර යා කරමු.**

| | | |
|---|---|---|
| 11. | පැරණි ජන කතාවකි. | විවිධ භූමිකා |
| 12. | ජීවිතයේ ලද අත්දැකීම් ගනි | පිටපත |
| 13. | චරිතයක් තුල ඇත | අන්දරේ සීනි කෑ හැටි |
| 14. | නාට්‍යයක් සඳහා අනිවාර්ය වේ. | අනුකරණය කල හැකි පරිසර සංස්ධියකි. |
| 15. | හිරු නැග ඒම | ක්ෂණික නිරූපණයේ දී |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තොරා දක්වන්න.**

(සබකෝලය, ප්‍රේක්ෂකයා, අධ්‍යක්ෂක, රූපණය, වේදිකා නාට්‍ය)

16. නළුවකු රඟපෑමේ දී ................................ තොරවිය යුතුය.

17. රඟපෑම යනු ....................................... ලෙස ද දැක්වේ.

18. ................................. ඉදිරිපත් කිරීමට රංග භූමියක් අත්‍යාවශ්‍ය වේ.

19. නාට්‍යයක මූලික අයිතිය ඇත්තේ ................................... මය.

20. නාට්‍යයකට නැතිවම බැරි කොට්ඨාශයකි ...................................

## II කොටස

- පහත සඳහන් ප්‍රශ්න අතුරින් පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 2කට පිළිතුරු සපයන්න.

1. පහත කවිය ආශ්‍රය කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"මව්පිය දෙදෙනාට සලකා පන්නේ
හිරිහැර කෙරුමට සිත නොමගන්නේ
බසිමින් පාරට පැන නුදුවන්නේ
දවසින් දවසට දැන හැදියන්නේ"

(i) ඉහත කවිය අඩංගු ග්‍රන්ථයෙහි නම කුමක් ද? (ලකුණු 2)

(ii) එම කවියේ ඇති යහපත් සහ අයහපත් ගුණයක් ලියන්න. (ලකුණු 2)

(iii) කවියේ අර්ථය කෙටියෙන් දක්වන්න. (ලකුණු 2)

(iv) මෙම ග්‍රන්ථයෙහි අඩංගු ඔබ දන්නා වෙනත් කවියක් ලියා දක්වන්න. (ලකුණු 2)

(v) මෙම ග්‍රන්ථය කුමක් අරමුණු කරගෙන රචනා වූවක් ද? (ලකුණු 2)

2. (i) රූපණය යනු කුමක්ද? (ලකුණු 2)

(ii) නළුවකු හට රංගනයේ දී චරිත කීයක් රඟපෑමට සිදුවේද? ඒවා නම් කරන්න. (ලකුණු 4)

(iii) ඒවාට උදාහරණ 2 බැගින් දක්වන්න. (ලකුණු 4)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

3. (i) ක්ෂණික නිරූපණය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

(ii) ඒ සඳහා නළුවාට අවශ්‍ය වන්නේ මොනවාද? (ලකුණු 4)

(iii) ඔබට ක්ෂණික නිරූපණය කල හැකි චරිත 6ක් දක්වන්න. (ලකුණු 3)

4. (i) නාට්‍යකරණය තුළ සමබරතාවය ගොඩනගා ගැනීමේ දී හඳුනාගත හැකි චලන ප්‍රධාන කොටස් කීයද? ඒවා නම් කරන්න. (ලකුණු 4)

(ii) නළු කාර්ය පහසු කරගැනීම සඳහා පුහුණු විය යුත්තේ මොනවාද? (ලකුණු 2)

(iii) ඉන් ඔබ දන්නා කිහිපයක් දක්වන්න. (4ක්වත් අවම විය යුතුයි) (ලකුණු 4)

5. (i) තත්කාලීන සමාජය පිළිබඳ අවබෝධයක් ලබාගත හැක්කේ ඔබ උගත් පාඩම් අතර කුමක් ඇසුරින්ද? (ලකුණු 2)

(ii) ඒ තුළින් හෙළිවන සමාජයේ සංස්කෘතිකාංග කිහිපයක් ලියන්න. (ලකුණු 4)

(iii) ඉහත ප්‍රශ්නයට අදාලව ඔබට සිත්ගත් අවස්ථාවකට අදාලව චිත්‍රයක් අඳින්න. (ලකුණු 4)